# අවුරුදු කුමාරයා



**කථාව : ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.**

# හැදින්වීම

කෘතියේ නම: අවුරුදු කුමාරයා.

කතෘගේ නම: ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

කතෘ අයිතිය : (කථාව සහ සිතුවම්)

ආර්.එම්.සසිනි සෙයන්සා රත්නායක.

කතෘගේ වෙනත් කෘති : පුංචි රුවනි,අපූරු යාළුවෝ

ආඩම්බර හා පැංචා

කෘතිය පළ කල දිනය : 2025.02.08

**ISBN අංකය: 978-624-208-412-1**

# පිදුම

මෙම කථාපොත ලිවීමට මා හට උපකාර කල මාගේ

අම්මාටත් පවුලේ සියළු දෙනා හා මාගේ ගුරු

මව්වරුන්ටත්  ආදරයෙන් මෙම පොත පුදකර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තුතිය.

මාහට අකුරු කියාදුන් මාගේ ආදරණීය ගුරුතුමියන් වන රේනුකා ගුරුතුමියටත් මදාරා ගුරු හා මෙම අවස්ථාව මා හට ලබාදුන් මාගේ පාසලේ විදුහල්පතිතුමියට මාගේ ප්‍රණාමය පුදකර සිටිමි.

"කොහෝ! කොහෝ!"

"අක්කා...... කවුද ඒ කෑගහන්නේ?

ඒ තමයි කොහා.. නංගී ඔයා දන්නවාද

ඇයි කොහා කෑගහන්නේ කියලා..



නෑ මම දන්නෙ නෑ අක්කේ ..එයාට බඩගිනි වෙලාද?

නෑ අවුරුදු ලඟ එනවා කියන්නයි එයා කෑගහන්නේ’’



අවුරුද්දට හැමදේම අලුත් වෙනවා.

ගස් වල මල් පිරිලා,ගෙඩි පිරිලා,හැමෝම අලුත් ඇඳුම්

අඳිනවා...



''අර බලන්න නංගී අප්පච්චී බිත්තියේ තීන්ත ගානවා''

අපේ ගෙදර දැන් අලුත් වෙනවා.අපිට සෙල්ලම් කරන්න අන්න අත්තා ඔංචිල්ලාවක් බඳිනවා.



“මම නම් ගොඩාක් ආසයි මුං කැවුම් කන්න...මම නම් ආස අග්ගලා කන්න.අපේ අත්තම්මා හදන අග්ගලා හරිම රහයි.මේ පාර අත්තම්මා අපිට කෑම ගොඩාක් හදනවා කිවුවා .”



“අත්තම්මා කිවුවා මේ පාර අවුරුද්දට අවුරුදු කුමාරයා අපේ ගෙදර එනවලු......අනේ අක්කේ මම නම් හරී ආසයි අවුරුදු කුමාරයා බලන්න.අත්තම්මා කිවුවා කෑම ගොඩක් හදන්නේ අවුරුදු කුමාරයාටලු



ඔන්න ඉතින් එදා දවස හරිම කලබලයි.අප්පච්චි ඉස්පිරිතාලේ යන්න ලෑස්ති වෙලා, උදේම අත්තම්මා මල් කඩලා වතුර වීදුරුවට පිච්චමල් දාලා අප්පච්චි එලියට එනකම් බලන් හිටියා.



“පරිස්සමට එක්කන් එන්න මයෙ පුතේ” අත්තම්මා කියනවා අපිට ඇහුණා.නංගිටයි මටයි හරිම සතුටුයි,”අවුරුදු කුමාරයා එනවා“මම නංගිට කිවුවා.



"පීප්!  පීප්! අප්පච්චිගේ කාර් එකේ සද්දෙ ඇහුණා...අත්තම්මා අප්පච්චි ආවා......''අපි කාර් එක ළඟට දුවගෙන ගියා..අනේ අම්මා...එදා තමයි අම්මා ඉස්පිරිතාලේ ඉඳන් ගෙදර ආවේ.අප්පච්චි දොර ඇරියා අම්මා හෙමිහිට බැස්සා.



අම්මගේ අතේ ලස්සනම ලස්සන චුටි රෝස මලක් වගේ චූටිම චූටි මල්ලි බබෙක් හිටියා....එයා හෙමිහිට අඩනවා වගේ ඇහුණා.අත්තම්මා දුවගෙන ආවා.  මේ තමයි අපේ අවුරුදු කුමාරයා.



අපිට මේ පාර අවුරුදු අරන් ආපු කුමාරයා තමයි මල්ලි බබා.එයා හරිම ලස්සනයි, චූටියි.නංගියි මමයි අම්මගේ ඇගේ එල්ලිලා ගෙදර ඇතුලට ආවා.



ඊට පස්සෙ මල්ලි බබාව අපේ ඇද උඩින් තිබ්බා.අපි හැමෝටම හරිම සතුටුයි.අපි හැමෝම වට වෙලා මල්ලි දිහා බලන් හිටියා....

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්